# ඇට අටක් සහ පොල් ගෙඩි අටක්



අතීතය අමතක කළ මිනිසාට අනාගතයක් නැත යන පාඨය මට මතක් වූයේ මෑතකදී ලාබාල පාසල් ශිෂ්‍යාවක් විසින් පොල් ගෙඩි අටක් සොරකම් කළ කතාව කරළියට ආ නිසාය. හොරණ ශ්‍රී මේධංකර විදුහලේ ඉගෙනුම ලැබූ මහේෂිකා නමැති දැරිය ඒ අසල වත්තකට පැන පොල් ගෙඩි අටක් සොරකම් කිරීමත්, ඇය එම සොරකම කළේ විදුහල්පතිවරයා ගේ නියෝගයට අනුව පාසලේ පන්ති කාමරවලට තීන්ත ආලේප කිරීම පිණිස ගොඩනැගූ අරමුදලට මුදල් ලබාදීමට බවත් පැවසීම රටේ මාධ්‍යවල උණුසුම් පුවතක් බවට පත් වූයේ එය උසාවිය දක්වා දුරදිග යාම නිසාය.

තමන්ගේ දෙමව්පියන්ට රුපියල් අටසීයක තරම් මුදලක් ලබාදීමට වත්කමක් නොවූ හෙයින් තමා මේ පොල් හොරකමට යොමුවූ බව ඇය උසාවියේදී පවසා තිබිණි. අන්තිමේදී එය බඩගින්නට පාන් කෑල්ලක් පොගා කන පොල් කිරි හොද්දක් සේ රටේ ජනතාවගේ හදවත් උණු කරන පුවතක් සේම ජනාධිපති මාළිගාවද කඳුලින් තෙත් කරන පුවතක් බවට පත්විය. එහෙත් විදුහලේ විදුහල්පතිවරයා පවසන්නේ තමා අඟහිඟකම්වලින් පිරි දරුවන් මේ අරමුදල් එකතු කිරීමේ ව්‍යාපෘතියෙන් නිදහස් කළ බවය. එයට මෙම ශිෂ්‍යාවද අයත් බව ඔහු පවසයි. ඔහුට අනුව මෙම ශිෂ්‍යාව බොරුකාරියකි. ඔහු පමණක් නොව පොල්ගස් හිමිකරුවා හා අවට ජීවත්වන ගම්වාසීන්ද පවසන්නේ මෙම දැරිය බොරු දෙසා බාපු බවය. ඇය අවට වතුවලට පැන පොල් පුවක් සොරකම් කරන්නේ අද ඊයේ සිට නොවන බව ඔවුහු මාධ්‍යවලට ප්‍රකාශ කළහ. ඔවුන් පමණක් නොව බස්නාහිර පළාතේ මහ ඇමතිවරයා පවා පවසන්නේ මෙම දැරිය පවසන්නේ අසත්‍යයක්ම බවය. කෙසේ නමුත් ඇය දැන් මෙම චෝදනාවලින් නිදහස්ය. ඒ වගේම ඇයට වඩා ලක්ෂ ගණන් සොරකම් කරන හා කළ විදුහල්පතිවරයාගේ ප්‍රෝඩාවන් හා වංචාවන්ද මේ තුළින් එළියට පැන නිදහසේ සැරිසරන්නට පටන්ගෙන ඇත. එහෙත් ඔහු තාම උසාවි ගොස් නැත. ඔහුව උසාවියට යවන්නටද කෙනෙකු දැනට නැත.

අධ්‍යාපන ඇමතිවරයා චක්‍ර ලේඛණ නිකුත් කරමින් කියා සිටින්නේ පාසල් සංවර්ධනයට මුදල් එකතු කිරීම තහනම් බවය. ඔහු අඩු නින්දෙන් අවදි වූ වයසක මිනිසෙකු සේ දකින සිහිනය සිහිනයක්ම පමණි. අප දන්නා පරිදි ලංකාවේ සුපිරි සේම දෙමව්පියන් කිසිම ප්‍රියක් නොදක්වන පාසල් පවා අද දහස් ගණන්වලින් මුදල් එකතු කරයි. සමහර පාසල්වලට එකතුවන මුදල් ගිලින බහිරවයන් කොතෙකුත් සිටියත් ඒ බහිරවයන් අදත් නිදැල්ලේ තම කටයුතු කරගෙන යන්නේ අධ්‍යාපන ඇමතිවරයාගේ චක්‍රලේඛණවලට පයින් ගසාය.

අපේ රටේ වැඩියෙන්ම බොරු දෙසාබාන්නේ දේශපාලඥයන්ය. ඒ බව කුඩා දරුවෝ පවා දනිති. එසේ බොරු කියන දේශපාලඥයන් ඊට පසු පළමු පුරවැසියා ගේ අනුගාමිකයන් වී ඔහුගෙන් ප්‍රධාන තනතුරු ගෙන මුල් පුටුවලට පත්වෙති. ඩඩ්ලි සේනානයක බත්දුන් පියා බවට පත්වූයේ කාලයක් නොමිළේ හාල් සළාකය ලබාදීමෙනි. ඊළඟ ඡන්දයේදී බලය ලබා ගැනීමට සිරිමාවෝ බණ්ඩාරනායකද හඳෙන් හෝ හාල් ගෙනැවිත් නොමිලේ ලබාදීමට පොරොන්දු වූවාය. එම පොරොන්දුවෙන් පසු ඇය අගමැතිනිය විය. ඊට පසු ජේ ආර් ජයවර්ධන බලයට ආවේ ධාන්‍ය රාත්තල් අටක් නොමිලේ ලබාදෙන බවට පොරොන්දු වෙමිනි. එහෙත් ඔහු දුන් ඇට අටක් නැත. ඊට පසු ආ ප්‍රේමදාස ජනාධිපතිවරයා බත් කා අතුරුපසට ගස්ලබුත් මේස් සපත්තු පළඳ දරුවන්ට පාසල් යන කාලයක් උදා කරන බව පැවසුවේය. ඒ සමඟම ඔවුන්ට විකුණාන් කන්නට යුද්දයක්ද තිබුණහ. ආර්ථික අමාරුකම වසාගෙන යුද්දය ජයගන්නට සහයෝගය දන් ජනයාට දෙන ඊළඟ ඡන්ද ගුන්ඩුව බොරුවම බව මහජනතාව දැන දැනත් බොරුවට නැවතත් රැවටෙති. ඊට පසු රටේ බඩු මිල අධික බව කියා කෑ ගසන විපක්ෂයේ පිරිස් බඩුමිල අඩු කරන බවට පොරොන්දු දී බලයට පැමිණියහ. එයින් ප්‍රධානම ආහාරය වූයේ පාන්ය. එහෙත් අද පාන් ගෙඩිය සැහැල්ලු වී රුපියල් පනහ ඉක්මවමින් සීඝ්‍ර ගමනක යෙදෙමින් උඩුසුළගට ගසාගෙන යාමට තරම කෙට්ටු ව ඇත.

රූපවාහිනියෙන් ගුවන් විදුලියෙන් හිමිදිරියේ ඇසෙන මුසාවාදා වේරමණී පරදා දිනපතාම බොරු කියන දේශපාලඥයන් බිහිවීමත් ඔවුන්ගේ දෑත්වල පිරිත් නූල් ගැට ගැසීමට පන්සල්වලින් ස්වාමීන් වහන්සේලා ඕනෑ තරම් බිහිවීමත් නිසා අද අප රටේ බොරුව සදාතනික සත්‍යයක් බවට පත්ව ඇත. එම පරපුරින් උපන් එක් දැරියකි මහේෂිකා. මහේෂිකාගේ අත්තම්මලා සීයලාගේ කාලයේ බොරුව යනු බයානක පාපයක් යැයි සිතූ කළ පසුවී ඔවුන්ගෙන් උපන් මහේෂිකාගේ දෙමව්පියන් හඳේ හාල් හා ඇට අටෙන් උපන් මිත්‍යාව සත්‍යයක් කරගත් පුරවැසියන්ය. ඒ පරම සත්‍යය හදවතේ සිර කරගෙන හූල්ලපු පරපුරෙන් මෙලෙවෙ එළිය දුටු මහේෂිකා නැමැති අද පරම්පරාව බොරුව කීම පමණක් නොව එය ප්‍රායෝගිකවද අත්හදා බලන්නට පුරුදු වී ගෙන එන පරපුරයි. අද නැති බැරිකම් හා ආර්ථික පීඩනය තුළ බොරුවට විශාල තැනක් ලබාදී අත්තේ වත්මන් දේශපාලනයමයි.

අද රට දුවන්නේ බොරෙුවෙන් බව කුඩා දරුවන් පවා දනී. ගෙයින් ගෙයට ඡන්දය ඉල්ලාගෙන මන්ත්‍රීවරයකු දුටු කුඩා දරුවෙක් "අන්න අම්මෙ අර බොරු කියන මාමා යනවා" කියා තම මවට කියූ බව මට ඇසුනේ මගේම ගම් පළාතෙනි. බොරුවෙන් වංචාවෙන් උපදින දවස තුළ උපදින දරුවන්ද බොරුවට වංචාවට හුරුවන්නේ අද එය සමාජ සම්මතයක් බවට පත්ව ඇති හෙයිනි. මෑතකදී අගවිනිසුරුවරියට එරෙහිව පැවති දෝෂාභියෝගයේදී ජනාධිපතිවරයා පැවසුවේ තමා තරාතිරම නොබලා දඬුවම් ලබාදෙන බවයි. එසේ ඔහු තරාතිරම නොබලන්නේ නම් කෝප් වාර්තාවේ දූෂණ වංචාවන්ට සම්බන්ධවූවන්ට එරෙහිව ගත් පියවර කුමක්ද ? එසේම වංචාවන්ට



ලක්ෂ්මන් කොඩිතුවක්කු

දූෂණවලට හා මිනීමරුම්වලට පවා සම්බන්ධ මර්වින් සිල්වාට එරෙහිව ගත් පියවර කුමක්ද ? ආසනය අහිමි කිරීම තරාතිරම නොබලා ලබාදෙන දඬුවමක්ද ? තමන්ගේ කැතකුණු සුද්දකරමින් තමන්ට ආවඩන සියල්ලන්ගේම දූෂණ වංචා යටපත් කරමින් ඔවුන්ව ආරක්ෂා කිරීම තරාතිරම නොබලා දඬුවම් ලබාදීමක්ද ?

අද රටේ විනය පිරිහෙමින් පවතින්නේ රටටම කඩා පාත් වූ කොඩිවිනයක් සේය. තම භාණ්ඩ විකුණා ගැනීමට වෙළෙන්දන් රූපවාහිනිය වෙළඳ වාහිනියක් කරගනිමින් තම බොරුව රට පුරා ප්‍රචාරය කරයි. ටියුෂන් කඩ රට පුරා බිහිවෙමින් බොරුවෙන් හෝ විභාගවලට ලිවීමට මල්වැනි දරුවන් රොබෝවරුන් බවට පත් කරයි. ප්‍රශ්නපත්‍ර පිළිතුරු හොරකම් කර ඔහේ විභාගවලට ලිවීමට උනන්දු වන අනාගත පරපුරක් රටතුළ දළු ලා




වැඩෙයි. ණය පියවා ගැනීමට ලෝකෙට බොරු කියන දේශපාලන නායකයන්, ජනතාව ළඟ තවත් මුසාවක් දෙසා බාන්නේ ඊළඟ ඡන්දයේදී බලය ලබාගැනීමටය. එහෙයින් තරාතිරම නොබලා මිනීමරන සමාජයක්ද රට තුළ බිහිවී ඇත්තේ ධනය බලය, නිලය අතර ඔන්චිලි පදින බොරුවටද මහා ඉල්ලුමක් ලබා දෙමිනි.

එහෙයින් අද බොරු කියන දේශපාලකයන් බොරු කියන්නේ අපායේ යන්නැති බව දැන දැනය. ඒ බොරුව නමැති අමාව ඔවුන්ට දිව්‍යලෝකයෙ තනන ප්‍රධාන මාර්ගය නිසාය. බොරුව චිරාත් කාලයක් වැජඹීමට ඇති කප්රුක නිසාය. ඒ නිසා හෙට දිනයේ ගෑස් සිලින්ඩරයක් සමඟ පාන් රාත්තල් දහයක් නොමිලේ දෙන බව කියන ප්‍රධාන දේශපාලන නායකයකු බිහි වුවහොත් ඔබ පුදුම නොවන්න. එසේම එම සිලින්ඩරයේ ගෑස් තිබෙනවාද කියා ඔබ අසන්නේද නැත. පන්සිල් පද පහ ඉවත් කිරීමට උත්තරීතර යැයි කියාගන්නා පාර්ලිමෙන්තුවේ පනතක් සමමත කරගන්නට උත්සහ ගත්තොත් එයටද පදුම නොවන්න ඒ පන්සිල් පද කඩන හොරු රැලක් ඔබ විසින්ම උත්තරීතර කර ඇති නිසාය. බොරු කිව්වද එය බොරුව බව දැන දැනම බලයට පත් කරන්නට තරම් අහිංසක බොරුව සමාන්‍ය දෙයක් තරම් යැයි අදහන ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් අප රටේ තවමත් ජීවත්වන නිසාය. මහේෂිකා උසාවි ගියද, බොරුව කියන සොරකම් කරන දහස් ගණනක් සුර සැප විඳිමින් යහතින් ජීවත් වන්නේද ඒ බොරුවම නිසාය. උපන්දා සිට බොරු අසන දරුවාට බොරු කියන එක මහ කජ්ජක් නොවේ. එය නැතිබැරිකම අගහිගකම එක්ව බොරුව එකතු කරගත් විට බඩගින්න නිවාගන්නට හැකි පිළියමක් නිසාය ඒ නිසා ඇය ඇට අටෙන් හාල් සේරුවෙන්, පාන් රාත්තලෙන් යුද්දයෙන් විරැකියාවෙන් උපන් අපේම දැරියකි. දේශපාලකයන්ට වඩින අප ඇයට සමාව දිය යුතුමය.

# දවල් හීන




'' මොකාද බොල ඔය නාන කාමරේ
පැත්තේ කෙඳිරිගගා අඬන එකා?
පූසද? බල්ලද? කටුස්සද?''

''ඉහි...ඉහි...නෑ
මහරාජෝත්තමයාණෙනි, මම ලේනා.
මහලේනා.''

''අප්පොච්චියේ, මොකද ලේනෝ ඔය හැටි බෑගිරි ගහන්නේ?''

''කුමන්ත්‍රණයක් මහරාජාණෙනි, කුමන්ත්‍රණයක්.''

''ඈ...මට විරුද්ධව?''

''නෑ මේක මට විරුද්ධව, මගේ පුංචි පුතා පාසිකුඩා වෙරළේ...''

''ඔව් ඔව් ඔව් පාසිකුඩා වෙරළේ කොලුකම පෙන්නලා වෙච්ච සංගෙදියනේ ඔය කියන්නේ. මම දන්නවා ඔය කතාව.''

''දැන් ඔය කේස් එක ඇදලා අරගෙන මගේ අගමැතිකමට කෙලින්ඩ ලොකු කුමන්ත්‍රණයක් යනවා රජතුමනි.''

''මොනවා මහලේනෝ, කවද ඉඳලද උඹ අගමැති වුණේ?''

''ඇයි රජතුමණි, ඊළඟට අගමැතිකමට හැම සුදුසුකමක්ම තියෙන්නේ මටනේ.''

''හැබෑට මමවත් දැනගෙන හිටියේ නෑනේ, කියහං බලන්ඩ ලේනෝ උඹේ සම්පූර්ණ නම.''

'I. O. සිරිසේන''

''ඔය නමේ කොතනක හරි රාජපක්ෂ කියලා ගෑවිලාවත් තියනවද ලේනෝ?''

''මිහු, නෑ''

''එහෙනම් කොහොමද ලේනෝ අගමැතිකමට හැම සුදුසුකමක්ම තියනවා කියන්නේ. උවමනාම එක නැතුව. උඹ කංසා මලක්වත් හැපුවද? නිකං පලයං ලේනෝ යන්ඩ දවල් හීන දකින්නේ නැතුව. හොං හොං හොං'

**ම.රා. සාද්**